# මැක්ඩොනල්ඩ් සංස්කෘතිය හා නිවී සැනසීම

පැරණි සිංහල බෞද්ධ සංස්කෘතිය විදග්ධ ගැමි සංස්කෘතියක් විය. එය ජනප්‍රිය සංස්කෘතියක් ද විය. මෙහි දී ජනප්‍රිය යන වචනය යොදා ගැනෙන්නේ ජනතාව අතර ප්‍රචලිත වූ යන අරුතිනි. ජනප්‍රිය සංස්කෘතියක් විදග්ධ නොවිය හැකි යැයි කියන්නේ බටහිර දෙස බලමිනි. බටහිරයන් අතර විදග්ධ සංස්කෘතිය සමාජයේ පවුල් කිහිපයකට පමණක් සීමා විය. බටහිර වැඩවසම් යුගයේ දී රදළයෝ ද විශ්ව විද්‍යාල අධ්‍යාපනයක් ලැබුවෝ ද ආදී සුළු පිරිසක් විදග්ධ සංස්කෘතියකට උරුමකම් කීවෝ ය. ඔවුහු සම්භාව්‍ය සාහිත්‍යය හැදෑරූහ. බටහිර ශාස්ත්‍රීය සංගීතය රස වින්දෝ ද ඔවුහු ම වූහ. බටහිර විද්‍යාව ද බිහිවූයේ ඔවුන් අතර ය. ඉංගිරිසි බස පවා ඔවුහු විදග්ධ ව යොදා ගත්හ. ඉංගිරිසි උච්චාරණයෙහි ද ඒ ඒ ප්‍රභේද අතර සාමාන්‍ය වෙනස්කම්වලට වඩා වෙනස්කම් විය. ලංකාවේ දකුණු පළාතේ සිංහල උච්චාරණය උඩරට සිංහල උච්චාරණයෙන් තරමක් වෙනස් වෙයි. එහෙත් එක් උච්චාරණයක් අනෙකට වඩා විදග්ධ නොවෙයි. භාෂාවක ප්‍රාදේශීය වශයෙන් එවැනි වෙනස්කම් අනිවාර්යයෙන් ම සිදු වෙයි. එහෙත් ඉංගිරිසි බස එසේ නොවේ. එහි ප්‍රාදේශීය වෙනස්කම්වලට අමතර ව ජනප්‍රිය, විදග්ධ භේදයක් ද වෙයි. ඔක්ස්ෆඩ් කේම්බ්‍රිජ් උච්චාරණ විදග්ධ ලෙස වැඩවසම් යුගයේ සිට ම සම්මතයක් බවට පත් වී ඇත.

එංගලන්තයේ වැඩවසම් යුගයේ දී ද ඉංගිරිසි භාෂා ප්‍රභේද හා සමාජ තීරු අතර දැඩි සම්බන්ධයක් තිබුණි. වැඩවසම් ක්‍රමය පෙරළා ධනපති සමාජයක් ඇති වීමෙන් පසුව මෙහි මූලික වෙනස්කමක් සිදු නොවිණි. අද ද රදළයෝ ද ධනපතියෝ ද උගත්තු ද සාමාන්‍ය ජනතාවගේ භාෂාවෙන් වෙනස් වූ විදග්ධ ඉංගිරිසියක් කතා කරති. අද ද ඔක්ස්ෆඩ් උච්චාරණය ඉහළින් සැලකෙයි. බ්‍රිතාන්‍ය ගුවන් විදුලි සේවය හා රූපවාහිනිය ද ඇතුළු බීබීසීයේ ඉංගිරිසියට එංගලන්තයේ පමණක් නොව මුළු මහත් ලෝකයේ ඉංගිරිසි කතාකරන්නන් අතර වැදගත් තැනක් හිමිවෙයි. එංගලන්තයේ අද පවා දිනපතා පුවත්පත් මගින් ද මේ විදග්ධ ජනප්‍රිය භාවය වෙන් කර පෙන්වනු ලැබේ. ටයිම්ස්, ගාඩියන් හා දැනට වසර කිහිපයකට පෙර ආරම්භ වූ ඉන්ඩිපෙන්ඩන්ට් වැනි දිනපතා පුවත්පත් සාමාන්‍යයෙන් විදග්ධ ගණයට වැටෙයි. ඩේලි මිරර්, සන් වැනි ටැබ්ලොයිඩ් ප්‍රමාණයේ පුවත්පත් ජනප්‍රිය ගණයෙහි ලා ගැනෙයි. රූපවාහිනී නාලිකා අතර ද එවැනි භේදයක් දැකිය හැකි ය. බීබීසී 2 හා චැනල් 4 වැනි නාලිකා විදග්ධයනට ය.

ඉංගිරිසි සංස්කෘතිය මූලික වශයෙන් ගත්කල තාක්ෂණික කළමණාකරණ විදග්ධ සංස්කෘතියක ආධිපත්‍යයක් ඇති සංස්කෘතියකි. එහි ජනප්‍රිය සංස්කෘතියට අයත් ඉංගිරිසි බහුතරයට වෙන ම භාෂා විලාශයක් උච්චාරණයක් සංගීතයක්, චිත්‍ර කලාවක්, සාහිත්‍යයක්, ආහාර පාන ආදිය වෙයි. එංගලන්තයෙහි පාරෙ තොටේ පෙනෙන්නට ඇත්තේ අල හා මාළු කන (Fish and Chips) පාපන්දු නරඹන, පබ් නමින් හැඳින්වෙන සුරා සැල්වල කන බොන, පොප් සංගීතයට සවන්දෙන ලන්ඩනයේ ඔක්ස්ෆඩ් වීදියේ සාප්පු සවාරි යන පහළ මධ්‍යම පන්තියේ ජනප්‍රිය සංස්කෘතිය යි. ඇමරිකාවෙන් බෝවී ඇති මැක්ඩොනල්ඩ් නමින් හැඳින්වෙන හැම්බර්ගර් ආදිය විකුණන කඩ ද පීට්සා නම් ඉතාලි කෑම විකුණන කඩ ද අයත් වන්නේ ජනප්‍රිය සංස්කෘතියට ය. එංගලන්තයේ විදග්ධ සංස්කෘතිය ඇත්තේ ඉහළ පෙළේ නාට්‍ය ශාලාවල, ඉතා සම්භාවනීය විද්‍යාඥයන්ගේ සංගමය වූ රාජකීය සංගමය (Royal Society), සම්භාව්‍ය ඔපෙරා ශාලාවල, චිත්‍ර ප්‍රදර්ශන ශාලාවල, කලා කෞතුකාගාරවල, ඔක්ස්ෆඩ් කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලවල සම්ප්‍රදායෙහි, සමස්තයක් ලෙස ගත් කල විශ්ව විද්‍යාල ආදියෙහි ය. විදග්ධ සංස්කෘතිය හා ජනප්‍රිය සංස්කෘතිය මුණ ගැසෙන තැන් නැතිවා නොවේ. ලෝඩ්ස් ක්‍රිකට් ක්‍රීඩා පිටිය, ඇස්කට් තුරග තරග පිටිය ආදී තැන්වල විදග්ධයෝ ද ජනප්‍රිය සංස්කෘතියට අයත් වූවෝ ද ගැවසෙති. එහෙත් ඒ වෙනස් ක්‍රීඩා මණ්ඩපවල ය.

විදග්ධ සංස්කෘතිය යනු ප්‍රභූ සංස්කෘතිය නොවේ. ප්‍රභූන් යැයි සැලකෙන පුද්ගලයන්ගේ සංස්කෘතිය ප්‍රභූ සංස්කෘතිය ලෙස සැලකෙයි. ප්‍රභූන් අතර විදග්ධයන් මෙන් ම විදග්ධ නොවන්නන් ද සිටිය හැකි ය. එමෙන් ම විදග්ධයන් ප්‍රභූන් නොවන්නන් අතර ද සිටිය හැකි ය. ප්‍රභූ යැයි කියන පුද්ගලයෝ විදග්ධ සංස්කෘතියට ගරු කරති. අඩුම තරමින් ගරු කරන බව පෙන්වති. ප්‍රභූ සමාජය යනු සංස්කෘතික ව ගත්කල ව්‍යාජ සමාජයකි. ප්‍රභූහු විදග්ධයන් ලෙස පෙනී සිටීමට උත්සාහ කළ ද ඔවුහු සමස්තයක් ලෙස ගත්කල විදග්ධයෝ නොවෙති. විදග්ධ සංස්කෘතිය හා ජනප්‍රිය සංස්කෘතිය කෘත්‍රිම සංස්කෘතීන් නොවේ. එහෙත් ප්‍රභූ සංස්කෘතිය ව්‍යාජ කෘත්‍රිම සංස්කෘතියකි. එහි කෘත්‍රිම මහේශාක්‍ය භාවයක් වෙයි. ප්‍රභූ සංස්කෘතිය යනු රඟ පෑමකි. බර්නාඩ් ෂෝ පඬිවරයා පිග්මැලියන් නම් නාට්‍යයෙන් මේ ප්‍රභූ සංස්කෘතිය

© Prof. Nalin De Silva

සරදමට ලක් කරන්නේ යැයි සිතමි. ඔහු ඒ නාට්‍යය ලීවේ විදග්ධ ඉංගිරිසි භාෂාවේ හා ලන්ඩන් නගරයෙහි වාසය කළ සාමාන්‍ය මිනිසුන්ගේ භාෂාවේ වෙනස්කම් පදනම් කර ගනිමිනි. විදග්ධ භාෂාව විදග්ධ ධනපති, රදළ හා උගත් පවුල්වල භාෂාව විය. පිග්මැලියන් නාට්‍යයෙහි ලන්ඩන් නගරයෙහි මල් විකුණන තරුණියක කතා කරන භාෂාව වෙනස්කර ඇයට විදග්ධ භාෂාවක් හා උච්චාරණයක් පුරුදු කර ඇය ප්‍රභූ සමාජය වෙත ගෙන යනු ලැබෙයි. පුහුණුවෙන් පසුව ඇය කතා කරන විලාශයෙන් ලන්ඩනයේ ප්‍රභූ සමාජය සිතන්නේ ඇය කුලීන කාන්තාවක් කියා ය. ප්‍රභූත්වය යම් පුහුණුවකින් කෘත්‍රිම ව ලබා ගත හැකි දෙයක් බව පිග්මැලියන් නාට්‍යයෙන් කියැවෙයි. මේ නාට්‍යය මයි ෆෙයාර් ලේඩි නමින් චිත්‍රපටියකට ද නැගිණි.

එංගලන්තයේ බහුතරයකගේ සංස්කෘතිය ජනප්‍රිය සංස්කෘතිය වුව ද එහි සංස්කෘතික ආධිපත්‍යය ඇත්තේ විදග්ධ සංස්කෘතියට ය. අවසානයේ දී ඉංගිරිසි සංස්කෘතිය යනු විදග්ධ සංස්කෘතිය මිස ජනප්‍රිය සංස්කෘතිය නොවේ. බටහිර විද්‍යාවට එංගලන්තයෙන් එක් කෙරුණු දෑ, සම්භාව්‍ය ඉංගිරිසි සාහිත්‍යය ආදිය නිව්ටන් හා ෂේක්ස්පියර් පඬිවරුන්ගේ කාලයේ සිට ම නිර්මාණය වූයේ ඉංගිරිසි විදග්ධ සංස්කෘතියෙහි ය. විදග්ධ වේවා, ජනප්‍රිය වේවා, ප්‍රභූ වේවා මේ සංස්කෘති සියල්ල ඉංගිරිසි සමාජයෙහි උප සංස්කෘතීන් වෙයි. ඉංගිරිසි සංස්කෘතිය සමස්තයක් ලෙස ගත්කල ඇංග්ලො සැක්සන් ක්‍රිස්තියානි වෙයි. කලින් කියන ලද උප සංස්කෘතීන් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය මත පදනම් වෙයි. ග්‍රීක යුදෙව් ක්‍රිසතියානි චින්තනය මත පදනම් වන්නේ ඇංග්ලො සැක්සන් ක්‍රිස්තියානි සංස්කෘතිය පමණක් නොවේ. ඇංග්ලො සැක්සන් ක්‍රිස්තියානී නොවන නෝර්වේ ආදී ස්කැන්ඩිනේවියානු සංස්කෘතීන් ද ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය මත පදනම් වෙයි.

ඉංගිරිසි සංස්කෘතිය පිළිබඳ ඉහත සඳහන් විස්තරය කෙරුණේ එය අපට අපේ ප්‍රවාද ගොඩ නැගීමේ දී අදාළ බැවින් ය. අප රටේ තිබුනේ සජාතීය (homogeneous) සංස්කෘතියකි. විදග්ධ ජනප්‍රිය යනුවෙන් භේදයක් නොවී ය. ගැමියෝ විදග්ධයෝ වූහ. සීගිරි ගිය ගැමියෝ විදග්ධ කවි ලිවූහ. මුළු මහත් සංස්කෘතිය ම නිවන පදනම් කර ගත්තේ විය. මා එසේ කියන්නේ මුළු මහත් සංස්කෘතියෙහි ම හරය නිවන වූ බැවින් ය. පැරණි සිංහල සාහිත්‍යයෙහි, කලාවෙහි, විද්‍යාවෙහි, ආචාර ධර්ම ආදී මේ සියල්ලෙහි නිවන මුල් වී ඇති ආකාරය දැක ගත හැකි ය. මහාවංශ කර්තෘ මහානාම හිමියන් මහාවංශය පවා ලිව්වේ හුදී ජන පහන් සංවේගය සඳහා ය. පැරණි සිංහල බෞද්ධයන් ප්‍රවාද ගොඩ නොනැගුයේ ද නිවන පදනම් කර ගනිමිනි. නිවන ප්‍රවාදයකින් විස්තර කළ හැකි දෙයක් නොවේ. නිවන අඩු තරමින් දෙයක්වත් නොවේ. භාරතීය බමුණන්ට බ්‍රහ්මන් ගැන ප්‍රවාද විය. බ්‍රහ්මන් යනු පවත්නා පරමාත්මය වෙයි. භාරතීය බමුණෝ ප්‍රවාද ගොඩ නැගීමේ රුසියෝ වූහ. බුද්ධ ධර්මයෙහි ද ප්‍රවාද ගොඩ නැගුවෝ බොහෝ විට භාරතයේ බ්‍රාහ්මණ වංශයෙහි උපත ලැබූ භික්ෂූන් වහන්සේ වූහ. භාරතීය මහායානයෙහි මෙන් ම භාරතීය ථෙරවාදයෙහි ද මෙය දැකිය හැකි ය. නාගර්ජුනපාදයෝ නිවන සම්බන්ධයෙන් ද ප්‍රවාදයක් ගොඩ නැගූහ. ථෙරවාදී සම්ප්‍රදායෙහි මිලින්ද ප්‍රශ්නය භාරතයෙහි වැඩ විසූ නාගසේන හිමියන් වටා විය. ථෙරවාදි අභිධර්මය පමණක් නොව සර්වස්තවාදී හා වෙනත් අභිධර්ම ද භාරතයෙහි ම නිර්මාණය විය. නාගර්ජුන හා නාගසේන හිමිවරු බ්‍රාහ්මණ වංශයෙහි උපත ලදහ.

කලින් ද සඳහන් කර ඇති පරිදි භාරතීය වෛදික සමාජය ආර්ය සංස්කෘතිය හා භාරතයේ ප්‍රාග් වෛදික සංස්කෘතීන් හා මිශ්‍ර වීමෙන් නිර්මාණය වූවක් විය. දකුණු ආසියාවේ ප්‍රාග් වෛදික සමාජවල හෝ චීනය ජපානය වැනි නැගෙනහිර ආසියාතික සමාජවල හෝ ප්‍රවාද දක්නට නැත. ප්‍රවාද නිර්මාණය භාරතයට ලැබුණේ බටහිර ආසියාවෙන් එහි පැමිණි ආර්යයන්ගෙන් බව පැහැදිලි ය. වෛදික සමාජය තුළ බමුණෝ ප්‍රවාද ගොඩ නැගීමේ ඒකාධිකාරයක් පවත්වා ගෙන ගියහ. වත්මන් නේපාලයේ උපත ලද සිදුහත් කුමරුට වෛදික බලපෑමට වඩා ප්‍රාග් වෛදික බලපෑම තිබූ බව පැහැදිලි ය. ශාක්‍ය දේශයට, වංගයට ආදී නැගෙනහිර භාරතයේ ප්‍රදේශවලට මෙන් ම දකුණේ වූ ලංකාවට ද වෛදික බලපෑමට වඩා ප්‍රාග් වෛදික බලපෑම අධික විය. ලංකාවේ කිසිම දිනක බමුණු සංස්කෘතික ආධිපත්‍යයක් තිබී නැත. වෛදික බලපෑමට වඩා ප්‍රාග් වෛදික බලපෑම වැඩි වූ බැවින් මේ ප්‍රදේශවල ප්‍රවාද නිර්මාණයට එතරම් වැදගත් තැනක් හිමි නොවිණි.

සිදුහත් කුමරු බුද්ධත්වය ලැබීමෙන් පසුව ධර්ම දේශනා කෙළේ ප්‍රාදේශීය භාෂාවලිනි. උන්වහන්සේ භික්ෂූන් වහන්සේලාට ජනපද නිරුක්තියෙන් ධර්මය දේශනා කිරීමට අවවාද කළහ. සංස්කෘතයෙන් ධර්ම දේශනා කිරීමට ඇතැම් භික්ෂූන් වහන්සේට අවශ්‍ය වූ විට බුදුන් වහන්සේ එයට විරුද්ධ වූහ. මෙය හුදෙක් ජනතාවට තේරුම් යන

© Prof. Nalin De Silva

ආකාරයෙන් ධර්මය දේශනා කිරීමට දෙන ලද උපදේශයක් පමණ ද යන්න විභාග කළ යුතු කරුණකි. ජනපද නිරුක්තිය, ප්‍රාකෘතය, ප්‍රාදේශීය භාෂා ආදී වශයෙන් විස්තර වන්නේ සංස්කෘත නොවූ භාෂා ය. එනම් වෛදික සංස්කෘතියෙහි ප්‍රකාශන මාධ්‍යය වූ සංස්කෘතයට පිටින් වූ භාෂා ය. බුද්ධ ධර්මය ප්‍රවාදවලට අනුබල නොදෙයි. බුදුන් වහන්සේ ප්‍රවාද ගොඩ නගා ධර්මය දේශනා නොකළහ. උන්වහන්සේට අවශ්‍යතාවයක් තිබිණි නම් එසේ කිරීමට හැකියාව තිබිණි. එහෙත් බුදුන් වහන්සේ දේශනා කෙළේ ප්‍රවාද ආශ්‍රයෙන් ධර්මය තේරුම් ගැනීමට නොව ප්‍රත්‍යක්ෂයෙන් එය තේරුම් ගැනීමට ය. බුදුන් වහන්සේ එව බලව යැයි දේශනා කළහ.

මෙය ඊනියා අනුභූතිවාදයක් නොවේ. අනුභූතිවාදය ම ප්‍රවාද මුල් කොට ගෙන පවතියි. බටහිරයන් දෙස බලා ඔවුන්ගේ ප්‍රවර්ග (categories) ඇසුරෙන් බුදු දහම විස්තර කරන්නට යන අනුකාරකයෝ බුදුන් වහන්සේ ද අනුභූතිවාදියකු බවට පත් කරති. කර්මය, පුනබ්භවය ආදිය පිළිබඳ බමුණන්ට තිබූ ප්‍රවාද බුදුන් වහන්සේට අවශ්‍ය නොවී ය. නිවන පසක් කිරීම මනසින් ද කළ නොහැකි ය. නිවන පසක් කිරීමට ඇති බාධාව ද මනස වන කල මනසින් නිවන පසක් කළ හැක්කේ කෙසේ ද? ප්‍රවාද තනන්නේ මනස ය. ප්‍රවාද නිවනට බාධාවක් වෙයි. එව බලව යන්න කිසිකබල් අනුභූතිවාදයක පිහිටා කරන ලද ඉල්ලීමක් නොව අනුභූතියෙන් බාහිර වූ එකක් විය. නිවන් අවබෝධයට, අවබෝධය, ප්‍රත්‍යක්ෂය ආදී වචන යොදා ගත්ත ද ඒ වචනවල සාමාන්‍ය අර්ථය  එයට අදාළ නොවේ. සාමාන්‍ය අර්ථය අදාළ නොවුණ ද කිට්ටුවෙන් යන වචන යොදා ගැනීමට බුදුන් වහන්සේට සිදු වී ඇති බව පැහැදිලි ය. භාෂාවේ ඇති අඩුපාඩු මෙන් ම භාෂාව විසින් කෙරෙන නොමග යැවීම් ගැන ද බුදුන් වහන්සේ දැන සිටියහ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva